රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 06/2022

මගේ අංකය : EST-1/CIRL/03/0001
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2022.12.28

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය සේවා ආයතනවල ඉවතලන කඩදාසි එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන්, 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය මුදල් හා භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ සංගෘහිත කර නිකුත් කර ඇති 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. පූර්ණ අයිතිය රජය සතු සමාගමක් වන සීමාසහිත ජාතික කඩදාසි සමාගම විසින් එහි අමුද්‍රව්‍ය ලෙස දැනට යොදාගනු ලබන්නේ ඉවතලන කඩදාසි පමණක් වන බැවින්, රාජ්‍ය ආයතන මඟින් දැනට පවතින විධිමත් ක්‍රමවේදය අනුව අපහරණය කිරීමට ඇති ලිපිගොනු හා කඩදාසි, ඉහත සඳහන් චක්‍රලේඛයේ II කොටසේ 11 ඡේදයේ විධිවිධාන කෙරෙහි අවධානය යොමු කරමින්, සීමා සහිත ජාතික කඩදාසි සමාගම විසින් නියම කර ඇති මිල අය කර ගැනීමෙන් අනතුරුව අපහරණය කිරීම කළ යුතුය.

එම්. එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112692158
විද්‍යුත් ලිපිනය : ade-I@pubad.gov.lk